## 2022 වර්ෂයට සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

2022 වර්ෂය සඳහා පහත ***"පළමු උප ලේඛනයේ"*** සඳහන් භාණ්ඩ, සේවාවන් සැපයීම හා ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා සුදුසුකම්ලත් නිෂ්පාදකයින්, ආයතන හා පුද්ගලයින් ලියාපදිංචි කිරීමට පහත කොන්දේසිවලට යටත්ව 2021.12.07 දින දක්වා මවිසින් අයදුම්පත් භාරගනු ලැබේ.

01. සැපයුම්කරුවන්, සේවා සපයන්නන් හා කොන්ත්‍රාත්කරුවන් ලෙස ලියාපදිංචිවීමට අපේක්ෂා කරන අය විසින් ඒ සඳහා පහත ***"දෙවන උප ලේඛනයේ"*** සඳහන් පරිදි සකස්කරගත් අයදුම්පත්‍රයක් මගින් 2021.12.07 වන දින හෝ ඊට ප්‍රථම අදාල අයදුම්පත ***"සභාපති, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව, පැල්මඩුල්ල."*** යන ලිපිනයට අතින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

02. එලෙස 2022 වර්ෂයට සැපයුම්කරුවකු වශයෙන් ලියාපදිංචි වීමට අයදුම්පත්‍රය ඉදිරිපත් කරන විට තමා ලියාපදිංචි වීමට අදහස් කරන අයිතමය ඉදිරියෙන් සඳහන් කර ඇති ලියාපදිංචි ගාස්තුව ***"සභාපති, පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව"*** නමට ලියන ලද චෙක්පතකින් හෝ මුදලින් ගෙවිය යුතු අතර, මුදල් ඇනවුම් භාරගනු නොලැබේ.

03. එක් අයදුම්පත්‍රයකින් ලියාපදිංචි විය හැක්කේ එක් සේවාවක්, සැපයුමක් හෝ කොන්ත්‍රාත් අයිතමයක් සඳහා පමණි. අයිතම කිහිපයක් සඳහා ලියාපදිංචි වීමට අදහස් කරන්නේ නම් වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කළයුතුය.

04. මේ සම්බන්ධයෙන් විමසීම් කිරීමට අවශ්‍ය වුවහොත් පහත සඳහන් කාර්යාලීය දුරකථන අංක සඳහා ඇමතිය හැකිය.

දු.ක. 045-2274375 ෆැක්ස් - 045-2274993

2021.11.01 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දීය.

එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න,
සභාපති,
පැල්මඩුල්ල ප්‍රදේශීය සභාව.

## පළමු උප ලේඛනය

| අයිතම අංකය | සැපයුම් හා සේවා | ලියාපදිංචි ගාස්තුව රු: |
|---|---|---|
| | **භාණ්ඩ** | |
| 01 | කාර්යාලීය සියලුම ලිපි ද්‍රව්‍ය, පාරිභෝගික භාණ්ඩ, සනීපාරක්ෂක ද්‍රව්‍ය. | 1500.00 |
| 02 | කාර්යාල යන්ත්‍ර සූත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ඡායාපිටපත් යන්ත්‍ර | 1500.00 |
| 03 | පරිගණක යන්ත්‍ර (ආනයනික/එකතුකළ) හා උපාංග (මෘදුකාංග/දෘඩාංග) | 1500.00 |
| 04 | කාර්යාලීය ලී බඩු හා වානේ ගෘහ භාණ්ඩ | 1500.00 |
| 05 | විදුලි හා විද්‍යුත් උපාංග, වායුසමීකරණ යන්ත්‍ර | 1500.00 |
| 06 | සියලුම මෝටර් රථ අමතර කොටස් (ඩීසල්/ පෙට්‍රල්/ ඉදිකිරීමේ යන්ත්‍ර) | 1500.00 |
| 07 | ටයර්, ටියුබ් හා බැටරි | 1500.00 |
| 08 | රබර් සීල්/ දින මුද්‍රා හා නාම පුවරු සැපයීම හා සැකසීම. | 1500.00 |
| 09 | ආහාරපාන හා සංග්‍රහ සඳහා අවශ්‍ය උපාංග සැපයීම. | 1500.00 |
| 10 | කාර්යාලීය බෑග් සහ සම්භාණ්ඩ සැපයීම. | 1500.00 |
| 11 | ඉදිකිරීම් ද්‍රව්‍ය (සිමෙන්ති, යකඩ, හුණු, ටයිල්, තීන්ත) ආදිය. | 1500.00 |
| 12 | ඉදිකිරීම් ද්‍රව්‍ය (ගල්, මැටල්, වැලි, ගඩොල්, බ්ලොක්ගල්, සැටලින්ලෑලි, උළු, උණ ලී, දැව මුක්කු, පොල්අතු සහ දර ආදිය) | 1500.00 |
| 13 | ඉදිකිරීම් කටයුතුවලට යොදා ගන්නා වාහන කුලී පදනම මත ලබා ගැනීම.  (ලොරි, ට්‍රැක්ටර්, ටිපර්, බැකෝ සහ බර යන්ත්‍ර) | 1500.00 |
| 14 | අනෙකුත් වාහන  කුලී පදනම මත ලබා ගැනීම. (ත්‍රිවිලර්, කැබ් රථ, යතුරු පැදි) | 1500.00 |
| 15 | රසායනික ද්‍රව්‍ය (පොහොර, වල්නාශක, කෘමි නාශක හා පුපුරණ ද්‍රව්‍ය) | 1500.00 |
| 16 | දැව සැපයීම (ලෑලි, පරාල, රීප්ප ආදි) | 1500.00 |
| | **සේවාවන්** | |
| 17 | මෝටර් රථවල සියළුම අලුත් වැඩියා කටයුතු (ඩීසල්/පෙට්‍රල් වාහන, ඉදිකිරීම් යන්ත්‍ර) | 1500.00 |
| 18 | මෝටර් රථ කුෂන් වැඩ හා හුඩ් වැඩ. | 1500.00 |
| 19 | වාහන සේවා කිරීම. | 1500.00 |
| 20 | කාර්යාලීය සියළුම යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම හා සේවා කිරීම. | 1500.00 |

| | | |
|---|---|---|
| 21 | ගෘහ භාණ්ඩ අලුත්වැඩියාව. | 1500.00 |
| 22 | ලියවන පට්ටල් වැඩ, වැල්ඩින් වැඩ, හයිඩ්‍රොලික් හෝස් අලුත්වැඩියාව | 1500.00 |
| 23 | විදුලි අලුත්වැඩියාවන් (ඒසි/ඩීසී- වාහන, කාර්යාල හා නිල නිවාස) | 1500.00 |
| 24 | වායුසමීකරණ, ශීතකරණ අලුත්වැඩියාව හා සේවා සැපයීම. (කාර්යාල/ නිවාස/ වාහන) | 1500.00 |
| 25 | ඇළුමිණියම්වලින් කෙරෙන නිර්මාණ වැඩ. | 1500.00 |
| 26 | සංග්‍රහ කටයුතු සඳහා අවශ්‍ය සේවා සැපයීම. | 1500.00 |
| 27 | ගිනි නිවන උපකරණ සවිකිරීම, නඩත්තුව හා සේවා සැපයීම. | 1500.00 |
| 28 | තිරරෙදි, මේස රෙදි, නිල ඇඳුම් රෙදි සහ සාරි සැපයීම. | 1500.00 |
| 29 | මිනින්දෝරු, නීතිඥ, වාස්තු විද්‍යාඥ, ව්‍යුහ ඉංජිනේරු සේවා සැපයීම. | 1500.00 |
| 30 | ආදාහනාගාර අලුත්වැඩියා හා ඒ සම්බන්ධ සේවා | 1500.00 |
| 31 | ඡායාරූප හා මුද්‍රණ සේවා සැපයීම. | 1500.00 |
| 32 | වාහන සඳහා ඉන්ධන සැපයීම. | 1500.00 |
| 33 | වාහන ෂීට් කුෂන් කිරීම. | 1500.00 |
| 34 | ගස් කැපීම. | 1500.00 |
| **ඉදිකිරීම් හා කොන්ත්‍රාත්කරුවන්** | | |
| 35 | රුපියල් 50000.00 දක්වා | 1500.00 |
| 36 | රුපියල් 50001.00 සිට 100000.00 දක්වා | 1750.00 |
| 37 | රුපියල් 100001.00 සිට 500000.00 දක්වා | 2000.00 |
| 38 | රුපියල් 500001.00 සිට 1000000.00 දක්වා | 2500.00 |
| 39 | රුපියල් 1000000.00 ට වැඩි | 3000.00 |

## දෙවන උප ලේඛනය

### පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

### 2022 වර්ෂයට සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

### අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ/ ආයතනයේ නම: ..........................................................................................

02. අයදුම්කරුගේ/ ආයතනයේ ලිපිනය: ..........................................................................................

03. අයදුම්කරුගේ/ ආයතනයේ දුරකථන / ෆැක්ස් අංක: ..............................................................

04. අයදුම්කරුගේ/ ආයතනයේ විද්‍යුත් තැපැල් ලිපිනය: ..............................................................

05. ලියාපදිංචිවීමට අදහස් කරන සැපයුම/ සේවාව/ කොන්ත්‍රාත්තුවට

අදාල අයිතම අංකය හා නම (පළමු උප ලේඛනය අනුව): ..........................................................

06. ව්‍යාපාරයේ වෙළඳ නාමය: ..........................................................................................

07. අයදුම්කරුගේ/ ආයතනයේ ලියාපදිංචිය

පිළිබඳ තොරතුරු: (අදාල ලිපිවල පිටපත් අමුණන්න) ..........................................................

08. VAT / NBT ලියාපදිංචිය පිළිබඳ තොරතුරු:

(අදාල ලිපිවල පිටපත් අමුණන්න) ..........................................................................................

09. ලබාදෙන උපරිම ණය සීමාව හා කාලය (දින ගණන): ..........................................................

10. පළපුරුද්ද පිළිබඳ තොරතුරු: (ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න) ..........................................

11. ඉදිකිරීම් හා කොන්ත්‍රාත් ක්ෂේත්‍රයේ ලියාපදිංචිය:

(අදාල සහතික වල පිටපත් අමුණන්න) ..........................................................................................

12. ජංගම ගිණුම් පිළිබඳ විස්තර

(ගිණුමේ නාමය හා බැංකු ශාඛාව) ..........................................................................................

13. ලියාපදිංචිය සඳහා ගෙවන ලද මුදල/

චෙක්පත් අංකය/ දිනය හා බැංකු ශාඛාව: ..........................................................................

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි තොරතුරු බවට සහතික වෙමි. 2022 වර්ෂය තුළ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ සැපයුම්/ සේවාව/ කොන්ත්‍රාත් කරුවකු වශයෙන් ලියාපදිංචි කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

දිනය: ......................................   ..............................................

අයදුම්කරුගේ අත්සන

හා නිල මුද්‍රාව